චක්‍රලේඛ අංක - LAE/2025-23

මගේ අංකය :- TR/LAE/2025/CIR
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත, රාජගිරිය.
2025.03.12

TR - 03

ඉතා වැදගත්

**සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් සහ**

**නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත.**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025**

1. **මැතිවරණ රාජකාරි අතරතුරදී කාර්මික දෝෂවලට ලක්වන රජයේ වාහන අළුත්වැඩියා කිරීම.**
2. **හදිසි අනතුරු වලට මුහුණ දෙන රජයේ වාහන සම්බන්ධව කටයුතු කිරීම.**

ඉදිරියේදී පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ මූලික සංවිධාන කටයුතු සිදු කිරීමේදී අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම පිණිස ඔබ විසින් යොදාගනු ලබන රජයේ වාහනයක් හෝ ඡන්ද විමසීමේ රාජකාරි කටයුතු සඳහා යොදවා ගැනීම පිණිස ගෙන්වා ගන්නා ලද රජයේ වාහනයක් හෝ නිලධාරීන් විසින් රැගෙන එන ලද රජයේ වාහනයක් හෝ **කාර්මික දෝෂයකට ලක්වූ විට හෝ හදිසි අනතුරකට ලක්වූ විට පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු බව කාරුණිකව දන්වමි.**

1. **මැතිවරණ රාජකාරි සඳහා යොදවන ලද වාහනයක් කාර්මික දෝෂයකට ලක් වුවහොත් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග.**

1.1 . සිදුවී ඇති කාර්මික දෝෂය පිළිබඳව හා සිදුකළ යුතු අළුත්වැඩියාව පිළිබඳව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෝටර් රථ වාහන පරීක්ෂක ලවා වාර්තාවක් ලබා ගන්න.

1.2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත ගරාජ තුනකින් මිල ගණන් ලබා ගැනීමට කටයුතු කරන්න.

1.3. එම මිල ගණන් පිළිබඳව මෝටර් රථ වාහන පරීක්ෂකගේ නිර්දේශය හා ඔබගේ නිර්දේශය ද සමඟ නොපමාව 011 2885228 ෆැක්ස් අංකය මඟින් අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත එවීමට කටයුතු කරන්න.

**ඔබගේ නිර්දේශය හා ඉහත සඳහන් තොරතුරු සලකා බලා මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයෙන් අදාළ අළුත්වැඩියාව සඳහා අනුමැතිය ලබාදෙනු ඇත. ඉන්පසුව,**

1.4. අනුමත ගරාජයෙන් අළුත්වැඩියාව සිදුකර ගන්න.

1.5. අළුත්වැඩියාව නිසි පරිදි සිදු කර ඇති බවට මෝටර් රථ පරීක්ෂක ලවා සහතික කරවා ගන්න.

1.6. අදාළ වාහනයේ ලොග් පොතෙහි සටහන් කිරීම. :- අළුත්වැඩියාව පිළිබඳ තොරතුරු හා ඒ සඳහා වැයවූ මුදල අදාළ ආයතන ප්‍රධානියා වෙත ලිඛිතව දන්වා එම තොරතුරු ලොග් සටහන් පොතෙහි සටහන් කල බවට වාර්තාවක් ගෙන්වා ගන්න.

1.7. සෑම අළුත්වැඩියාවක් අවසානයේම පහත තොරතුරු ප්‍රධාන කාර්යාලයේ ප්‍රවාහන අංශය වෙත යොමු කරන්න.

i. ලොග් සටහන යෙදවූ බවට ලබාගත් වාර්තාවේ පිටපතක්
ii. අළුත්වැඩියාව පිළිබඳ මෝටර් රථ වාහන පරීක්ෂකගේ වාර්තාව
iii. අවසන් බිල්පතේ පිටපතක්

1.8. අදාල අළුත්වැඩියාවෙන් පසු නිසි පරිදි බිල්පත් නිරවුල් කිරීම සඳහා ප්‍රධාන ගණකාධිකාරී මගින් ප්‍රතිපාදන වෙන්කරවා ගත යුතු අතර එසේ සිදුවන සෑම අළුත්වැඩියාවක් සම්බන්ධයෙන්ම වෙනම වාර්තාවක් තබාගත යුතු වේ.

වැදගත් : **★. මැතිවරණ කටයුතු සඳහා යොදවනු ලබන රජයේ වාහන හැර වෙනත් කිසිදු වාහනයක අළුත්වැඩියාවක් සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව මැදිහත් නොවිය යුතුය.**

**★★. විශාල අළුත්වැඩියා සහිත/ අබලන් වාහන ඡන්ද විමසීමේ රාජකාරී සඳහා යොදවා ගැනීමෙන් වැළකී සිටිය යුතුය.**

**★★★. වාර සේවා සිදුකිරීමට අවැසි වුවහොත් ඡන්ද විමසීම් කාල සීමාව තුළ ඊට අවශ්‍ය සම්පූර්ණ දුර ප්‍රමාණයම ධාවනය කර තිබිය යුතුය.**

## 2. <u>හදිසි අනතුරු වලට මුහුණ දෙන රජයේ වාහන සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග.</u>

මැතිවරණ රාජකාරී වල නිරත කරවන ලද වාහනයක් හදිසි අනතුරකට මුහුණ දුනහොත්, සාමාන්‍ය මාර්ග අනතුරකදී අනුගමනය කළ යුතු පරිදිම **<u>පොලීසියට වාර්තා කර අවශ්‍ය නීතිමය ක්‍රියා මාර්ග ගත යුතුය.</u>**

2.1. අනතුර පිළිබඳව අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) වෙතද, වාහනය අයත් ආයතනයේ ප්‍රධානියා / ප්‍රවාහන නිලධාරී වෙතද නොපමාව දැනුම් දිය යුතුය. තවද, එවැනි අනතුරු පිළිබඳව ඔබටද නොපමාව වාර්තා කරන ලෙස ප්‍රවාහන කටයුතු භාර නිලධාරීන් දැනුම්වත් කළ යුතුය.

2.2. වාහනයේ රක්ෂණාවරණය ලබා ගෙන ඇති අදාළ රක්ෂණ ආයතනයට දැන්වීම.

2.3. අනතුර සිදුවන අවස්ථාවේ රථය පැදවූ රියදුරුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීම.

2.4. අනතුර සිදුවන අවස්ථාවේ රථයේ ගමන් කළ වෙනත් පුද්ගලයින් වී නම් ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කර වාර්තාවක් ලබා ගැනීම.

2.5. රථයට සිදුවී ඇති හානි පිළිබඳව මෝටර් රථ පරීක්ෂක වරයෙකු / මාණ්ඩලික නිලධාරියෙකු ලවා පරීක්ෂා කර වාර්තාවක් ලබා ගැනීම.

2.6. "පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025 මූලික සංවිධාන කටයුතු වලට අදාල පරිපාලනමය කාර්යයන්" යනුවෙන් 2025.03.06 දිනැතිව නිකුත් කර ඇති අංක LAE/2025-20 දරණ චක්‍රලේඛයේ 7 වන ඡේදයේ පරිදි රථය පූර්ණ රක්ෂණය කර තිබිය යුතු බවට දැනුම්වත් කර ඇති බැවින් අලාභය අදාළ රක්ෂණ ආයතනයෙන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

2.7. අනතුරට පත් රථය අළුත්වැඩියා කිරීමට ප්‍රතිපාදන මෙම කොමිෂන් සභාවේ වැය ශීර්ෂ වලින් දරනු ලබන්නේ නම් ඉහත සඳහන් ලිපි ලේඛන වලට අමතරව පහත සඳහන් විස්තර ද එවිය යුතුය.

I. රථයට සිදුවී ඇති හානි පිළිබඳ සම්පූර්ණ විස්තරයක්
II. දිස්ත්‍රික් මෝටර් රථ පරීක්ෂකගේ වාර්තාවක් සමඟ දළ ඇස්තමේන්තුවක්
III. පොලිස් වාර්තාවේ සහතික කළ පිටපතක්
IV. අදාල රක්ෂණ ආයතනයෙන් අලාභය අය කර නොගැනීමට හේතු
V. අවම තරමින් රජයේ ලියාපදිංචි ගරාජ දෙකකින්වත් මිළ ගණන් ලබාගෙන තිබිය යුතු අතර ඒවායේ සහතික කළ පිටපත්
VI. අළුත්වැඩියාව පිළිබඳව ඔබගේ නිර්දේශය

2.8. මාර්ග නීති උල්ලංඝණය කිරීමක් හෝ බීමතින් රිය පැදවීම මත හෝ රාජකාරියෙහි යෙදුණු රියදුරු අධිකරණයක් වෙත ඉදිරිපත් කර වරදකරුවකු වී ඇත්නම්, අදාළ අලාභයන් ප්‍රතිපූරණය කිරීමට ඉල්ලුම් කිරීමට ප්‍රථම පූර්ණ පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට වාහනය අයත් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / සංස්ථාව වෙත දැන්විය යුතුය. **එම වාර්තාවේ නිර්දේශය මත අලාභය ප්‍රතිපූර්ණය කිරීම පිළිබඳව සළකා බැලිය හැකිය.**

3. මෙම චක්‍රලේඛයේ සඳහන් සියළු කරුණු පිළිබඳව ප්‍රවාහන විෂය භාර සියළු මාණ්ඩලික නිලධාරීන්, මැතිවරණ කාර්යාලයේ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී, ගිණුම් නිලධාරී, ගබඩා නිලධාරී දැනුවත් කර, එසේ කල බවත් මෙහි සඳහන් උපදෙස් / නියමයන් අනුව ක්‍රියා කරන බවටත් අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත ලිඛිතව වාර්තා කරන්න.

**සමන් ශ්‍රී රත්නායක,**
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

පිටපත් :
01. විගණකාධිපති
02. ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව
03. අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන)
04. ප්‍රධාන මූල්‍ය නිලධාරී
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක

} කාරුණික දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා